# - රුවන්පුර වැනුම -

සමනළ සිරස මිහිදුම් සළු සේද ඉරා
වැඳ සිරිපතුල සදහම් ගුණ දෝත දරා
හිනැහෙයි හිරු කිරණ පෙරඹර අහස අරා
පින්බර හැඟුම් මගෙ තුන්සිත පුබුදු කරා

කළු ගං නදී සිරිපතුලට සිරස නමා
මිණිකැට රුවන්කැට හැම ගං පතුලෙ දමා
යනවිට ගලා සරු කරණට දෙරණ තෙමා
ඒ සිරි බලන්නට දෑසක් කිමද පමා

තේවතු, රබර්වතු, පොල්වතු එල දරලා
කෙත්වතු සරු සාරවී ඇත කිරි වැදිලා
මේ බිම රුවන්පුර පින්බර සිරි දැකලා
පිටරැටියන්ගෙ සිත ගත නෙත ඇත රැඳිලා

සුන්දර සිංහරාජය ඈත වන පෙතේ
ලෝ උරුමයකි නංවන කඳුළු බිඳු නෙතේ
නිසි කල් යල් බලා වැහි බින්දු ගෙන එතේ
ඒ ගැන කියන්නට මට වචන මදි හිතේ

බැලු බැලු හැමත ගහකොළ හැම අත නෑර
එල දරනවා අතු අග අඹ-රඹ පේර
පෙන්වා ලොවට සොබ දහමේ රුව සාර
දියඇලි දසත නැගුවා පෙම් සිලිලාර

දුක් කම්කටොළු හිරිහැර කරදර බාදා
සතුට නසයි එය ජීවිතයට ආදා
වෙන් කර පඬුරු කීවොත් දුක සිත පාදා
සුරිඳු සමන් සැමවෙත ඇත සෙත සාදා

සරසවි රුවන්පුර පේනා අර කන්ද
පාරාදීසයකි පෙම්වත් මන නන්ද
බෙලිහුල් ඔයේ රළ පහරට පෙම් බැන්ද
සමනළ වැවට මතකයි ආදර කන්දී

කැත්තද උදැල්ලද හුරු දෑතට ගත්තූ
පෙරලති ගම්, පත්තු, සව්බල අලි ඇත්තූ
අවිහිංසක රුවන්පුර මේ බෝසත්තූ
සත්කාරයට ආගන්තුක පෝසත්තූ

ගැමියන් රුවන්පුර දනවා එඩිය පහන්
හිනැහෙන විටෙක පෙන්වා මුව මුකුළු දසන්
උපමා කුමට වැයුමට ඒ ගුණය සහන්
දැල්වූ වැනිය එකවර සිය දහස් පහන්



ඒ. ජී. ප්‍රියන්තා රෝහිණී සිරිසේන
ගිණුම් අංශය (පරිසර)
මහවැලි සංවර්ධන සහ පරිසර අමාත්‍යාංශය